ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**චීන භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම**

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ආරම්භ කිරීමට නියමිත චීන භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**චීන භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර) - Advance Certificate in Chinese (External)**

- පාඨමාලා කාලය : මාස - 08
- SLQF ස්තරය : 02 වන ස්තරය (Level 02)
- ඉගැන්වීම් මාධ්‍යය : සිංහල
- **මූලික සුදුසුකම් :**
  1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.
     **හෝ**
  2. චීන භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් (SLQF 01 වන ස්තරයට සමාන) සමත් වීම / ඒ හා සමාන පිළිගත හැකි වෙනත් සුදුසුකම් ලබා තිබීම.
     **හෝ**
  3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

- **පාඨමාලා ගාස්තුව** : අයදුම්පත් ගාස්තුව - රු. 500.00
  පාඨමාලා ගාස්තුව - රු. 19,500.00

  * (පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. පළමු වාරිකය රු. 14,500/-කි. එය ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු අතර ඉතිරි මුදල පාඨමාලාව ආරම්භ වී මාස දෙකක් ඇතුළත ගෙවිය යුතුය.)

- මෙම පාඨමාලා සඳහා ඉහත දක්වා ඇති අදාළ සුදුසුකම් සපුරන ගිහි/පැවිදි/ස්ත්‍රී/පුරුෂ ඕනෑම අයෙකුට ඉල්ලුම් කළ හැකිය.
- පාඨමාලා සඳහා මාර්ගගත ක්‍රමයට (Online) හෝ සම්මුඛ ක්‍රමයට සම්බන්ධ විය හැක.
- පාඨමාලා ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය පිරිසක් අයදුම්කර තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගන්න අවසාන දිනය 2024.06.30 වේ.

**පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම**

- විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියට (www.busl.ac.lk) පිවිස මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් ඉදිරිපත් කිරීම පෙර **පියවර 01** යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/NDVperVKi59txmtR7 ක්ලික් (Click) කර අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යොමු අංකයක් (Reference Number) ලබා ගත යුතුය.
- ඉන් පසු ලබා දී ආකෘතිය අනුව යොමු අංකය (Reference Number) නිවැරදිව සඳහන් කර මහජන බැංකුවේ දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක 008-1001-7001-4461 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව බැර කරන්න.
- අයදුම්පත පිරවීමට ප්‍රථම, උපදෙස් හොඳින් කියවා පහත ලියකියවිලිවල පරිලෝකන පිටපත් (Scan Copy) ලබා ගැනීම සිදු කළ යුතු අතර ඒවා pdf ආකෘතියට තිබිය යුතුය.
  - උප්පැන්න සහතිකය
  - පැවිදි අයදුම්කරුවන් සඳහා සාමණේර/උපසම්පදා සහතිකය
  - ජාතික හැඳුනුම්පත
  - අධ්‍යාපන සහතික
  - අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපත
- ඉහත කී සියලුම ලියකියවිලි සකස් කර ගත් පසු **පියවර 02** යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/nBtgPtGvp61Gy4kH6 ක්ලික් (Click) කර ගූගල් පෝරමයේ ඇති ප්‍රශ්නවලට නිවැරදි තොරතුරු ඉදිරිපත් කර 2024.06.30 දින දක්වා අයදුම්පත් යොමු කල හැකිය.

වැඩි විස්තර - පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (025-2057978)
විශ්වවිද්‍යාල වෙබ් අඩවිය (www.busl.ac.lk)

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය.